## CII 08 සිංහල හා දෙමළ ජනතාවගේ චාරිත්‍ර වාරිත්‍ර අතර සමවිෂමතා පිළිබඳ අධ්‍යයනයක්.(වැලිමඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය ඇසුරෙන්)

ජයසිංහ ඩී., දමයන්ති ටී.එම්. යු., දිළිනි කේ. කේ. එස්.

සිංහල අධ්‍යයනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය

මානව සමාජය හා සංස්කෘතිය අතර පවතින්නේ අවියෝජනීය සම්බන්ධතාවකි. මේ අනුව සිංහල හා දෙමළ ජනතාවගේ උපතේ සිට මරණය දක්වා චාරිත්‍ර වාරිත්‍ර අතර සමවිෂමතා ඔවුනොවුන්ගේ සංස්කෘතිය අනුව හඳුනාගත හැක. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වශයෙන් සිංහල හා දෙමළ ජනතාවගේ චාරිත්‍ර වාරිත්‍ර අතර සමවිෂමතා පිළිබඳ අධ්‍යයනය සිදුකිරීම සිදුවන අතර එම චාරිත්‍ර වාරිත්‍ර අනුගමනය කිරීමේ දී ඔවුනොවුන්ගේ අදහස් හා ආකල්ප සොයා බැලීම, අතීතයේ පැවති හා වර්තමානයේ පවතින චාරිත්‍ර වාරිත්‍ර අතර වෙනස්කම්, ඔවුන් අනුගමනය කරන චාරිත්‍ර වාරිත්‍ර තම ජීවිතවලට කොතෙක් දුරට බලපා ඇත් ද යන්න උප අරමුණු වේ. සිංහල හා දෙමළ චාරිත්‍ර වාරිත්‍ර වඩාත් සම්මිශ්‍රණය වූ සංස්කෘතියකින් හෙබි වැලිමඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ දික්කාපිටිය හා ඩයරබාවත්ත යන ග්‍රාම නිළධාරී ප්‍රදේශ අධ්‍යයන ප්‍රදේශ වශයෙන් තෝරා ගත් අතර ගුණාත්මක දත්ත මත පදනම් වූ පර්යේෂණයක් වන මෙම අධ්‍යයනයට ප්‍රාථමික හා ද්විතීයික දත්ත යොදා ගැණුනි. ප්‍රාථමික දත්ත සඳහා මුල් තැනක් ලබා දී ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණය මඟින් දත්ත රැස්කිරීම සිදු කළහ. මෙහි දී ප්‍රාථමික දත්ත යටතේ ප්‍රශ්නාවලි සමීක්ෂණය ප්‍රධාන විය. අධ්‍යයනය ප්‍රදේශයේ සිංහල පවුල් 287ක් හා දෙමළ පවුල් 97 ක් සිටි අතර එක් එක් ග්‍රාම නිළධාරී වසමෙන් 20% බැගින් නියදියක් තෝරා ගන්නා ලදි. සිංහල හා දෙමළ ජනතාව අතර පවතින සම චාරිත්‍ර හා විෂම චාරිත්‍ර ලෙස කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය. සිංහල හා දෙමළ විෂම චාරිත්‍ර වාරිත්‍ර, සිංහල ජනතාව පමණක් ( දරු උපතකට පෙර පිරිත් සජ්ඣායනය, පොහොය දින අනුව දරු උපතේ දින වෙන් කිරීම, දරුවෙකුගේ පොල් ගෑමේ චාරිත්‍රය, හිස කෙස් කැපීමේ පැරණි චාරිත්‍ර වාරිත්‍ර, මල්වර චාරිත්‍ර සඳහා නැන්දාගේ සහභාගීත්වය, කඩුලු බුලත් දීමේ චාරිත්‍රය, ගෝදාන පිංකම) හා දෙමළ ජනතාව පමණක් අනුමනය කරන චාරිත්‍ර වාරිත්‍ර වශයෙන් (දරු ගැබට මාස පහක් වීමේ දී නිවසේ උත්සවයක් පැවැත්වීම හා ඇයට රදන් දෙවියන් බැලීම තහනම් වීම, දරුවා ඉපදී දින 30 කෝවිලට රැගෙන යාම, විජය දසමි දින අකුරු කියවීම, මල්වර චාරිත්‍රවලට මාමාගේ සහභාගීත්වය, මාමා සමඟ විවාහ වීම, ඔප්පාරි කියවීම) ද වර්ග කෙරේ. සිංහල හා දෙමළ සම චාරිත්‍ර වශයෙන් (දරුවෙකු ලැබීමට පෙර මවගේ නිවසට යාම, වෘක්ෂ, දේව, ජ්‍යෝතිශ්‍ය පිළිබඳ විශ්වාස, සංස්කෘතික නැටුම්) ආගමික හා සමාජීය චාරිත්‍ර වාරිත්‍ර දැක්විය හැකි ය. මේ අනුව සිංහල ජනයාගේ චාරිත්‍ර දෙමළ ජනයාටත්, දෙමළ ජනයාගේ චාරිත්‍ර සිංහල ජනයාටත් මුහුවීම හේතුවෙන් සංස්කෘතික සංකලනයක් දක්නට ලැබේ.

**ප්‍රමුඛපද:** චාරිත්‍ර වාරිත්‍ර , සිංහල , දෙමළ, සමවිෂමතා, ආගම